**කෝර්ලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෝර්ලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උප වගන්තිය 172(1) සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට කෝර්ලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි අනුගමනය කළ ගිණුම් කරන ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි ගිණුම් කරන ප්‍රතිපත්ති නිසිපරිදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන බව. | ගිණුම් කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු. 18,195 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කරන බව. | ගෙවිය යුතු මුදල් ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට විදුලි පහසුකම් ලබා දීම සඳහා මඩකලපුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් සභාව වෙත ලබා දුන් රු.494,748 ක් ගිණුම්වල ජංගම වත්කමක් වශයෙන් දක්වා නොතිබුණි. | අදාල මුදල ගිණුම්වල ජංගම වගකීමක් වශයෙන් දැක්වීමට කටයුතු කරන බව. | ජංගම වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදි නියං කාලයේදී පානීය ජලය බෙදාහැරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කින් ලැබිය යුතු ඉන්ධන වියදම් රු. 253,467 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයෙන් දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කරන බව. | හිඟ මුදල් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයෙන් දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,598,405ක් වටිනා ගිණුම් ශේෂ 06 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, වත්කම් උප ලෙඛන සහ අයිතිය සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඇතැම් වත්කම් ලේඛන වල සටහන් කරන ලද අතර, පුස්තකාල පොත් සහ පරිගණක වල වටිනාකම තක්සේරු කිරීමට සැලසුම් කර ඇති බව. | වත්කම් වල ලියවිලි ලබා ගෙන ලේඛන ගත කිරිමට කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය හා මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්ගේ අංක BT/ACLG/PL/Road/2013 සහ 2013 ජුලි 10 දිනැති ලිපිය | සභා බලප්‍රදේශයේ සභාව විසින් හඳුනාගන්නා ලද මාර්ග 277 ක් ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර මාර්ගවල නම් ලැයිස්තුව ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අංක 20 දරණ විදුලි බල පනතේ 50 වනි වගන්තිය | මාළු වෙළඳ පොළෙහි තිබෙන කඩකාමර 41 කින් කඩවකාමර 30 ක් ලඟ තිබෙන කඩවල්වලින් තාවකාලික විදුලි සම්බන්ධතා නීතියට පටහැනිව ලබා ගෙන තිබුණි. | විදුලි සම්බන්ධතා ලබා ගෙන නොතිබුණු කඩ කාමර සඳහා නව විදුලි සම්බන්ධතා ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස අමාත්‍යංශයේ නාගරික සංවර්ධන අධිකාරියේ 2020 මාර්තු 02 දිනැති අංක 29 දරණ චක්‍රලේඛය | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමට දින 14 ක් ඇතුලත නිම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මාස 01 සිට 10 දක්වාවූ කාල ප්‍රමාදයකින් පසු ගොඩනැගිලි සැළසුම් සභාව විසින් අනුමත කර තිබුණි. | ගොඩනැගිලි බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය අනුව අදාල කාල පරිච්ඡේදයතුල ගොඩනැගිලි සැළසුම් අනුමත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම් ඉක්මවූ වියදම් රු. 1,903,574 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,384,985 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,800,000 | 393,691 | 393,691 | 11,937,904 | 2,000,000 | 203,087 | 203,087 | 11,937,904 |
| කුලී | 7,808,877 | 6,400,693 | 6,678,734 | 1,044,310 | 6,905,010 | 4,770,541 | 4,727,480 | 1,322,352 |
| බලපත්‍ර ගාස්තු | 4,575,000 | 3,320,865 | 3,541,165 | 1,212,360 | 4,600,000 | 3,225,570 | 2,157,320 | 1,432,660 |
| වෙනත් ආදායම් | 18,380,000 | 49,545,087 | 46,043,661 | 3,501,426 | 6,950,000 | 39,830,698 | 39,830,698 | - |
| එකතුව | 32,563,877 | 59,660,336 | 56,657,251 | 17,696,000 | 20,455,010 | 48,029,896 | 46,918,585 | 14,692,916 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් අයකළ යුතු මුද්දර ගාස්තු රු.5,734,810ක් විය. | පිළිතුරු එවා නැත. | මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට ගොඩනැගිල්ලක සැලැසුම් නිර්මාණය කළ හැක්කේ තනි මහලේ නිවාස සඳහා පමණක් වුවත් සමාලෝචිත වර්ෂය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් අඳින ලද දෙමහල් ගොඩනැගිලි 15 ක සැලැසුම් සභාව විසින් අනුමත කර තිබුණි. | අදාල කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාර ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඔට්ටමාවඩි මහජන පුස්තකාලයේ පොත් 3,225 ක් ප්‍රයෝජනයට ගත නොහැකි පොත් ලෙස තීරණය කර තිබුණද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පුස්තකාල පොත්වල වටිනාකමින් අස්ථානගත පොත් වල වටිනාකම තක්සේරු කර ඉවත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදි කරනු ලැබේ. | අස්ථානගතවූ පොත් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නඩත්තු කරන කළමනාකරණ මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා යොදවා ඇති SOLAR Inverter උපකරණය ක්‍රියාවිරහිතවී තිබුණද, එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | SOLAR Inverter උපකරණය සඳහා අමතර කොටස් ලබා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇති බව. | මෙම උපකරණය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව වෙත වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලබා දී ඇති, එහෙත් දීර්ඝ කාලයක සිට සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන, ට්‍රැක්ටර් ටේලර් සහ වතුර බවුසර් 08 ක් සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහනවල අයිතිය පවරා ගැනීමට කඩිනමින් ක්‍රියාකරන බව. | ට්‍රැක්ටර් ටේලර් සහ වතුර බවුසර් වල අයිතිය සභාවේ නමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු සහ අතිරික්ත**<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයහි තනතුරු 07 ක පුරප්පාඩු 05 ක් සහ අතිරික්ත 03 ක් පැවැති බව නිරීක්ෂණය විය. මෙය විධිමත් කර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේ අදාල කරුණු සම්බන්ධයෙන් නිසි කටයුතු කරන බව. | සේවක පුරප්පාඩු පිරවීමට සහ අතිරික්තය විධිමත් කර ගැනීමට කටයුතු කර යුතුය. |

## 4 ශිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරණ පනතෙන් සහ 2000 අංක 53 දරණ පනතෙන් සහ 2008 අංක 01 දරණ පනත්වලින් සංශෝධිත කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ 2022 ජනවාරි 27 දිනැති සහ 2264/18 අංක දරණ විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව සත්ව ඝාතකාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | පරිසර ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |